වාර්ෂික කාර්ය සාධන වාර්තාව
வருடாந்த செயலாற்றுகை அறிக்கை
ANNUAL PERFORMANCE REPORT

2022



රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
அரசாங்க அச்சுத் திணைக்களம்
DEPARTMENT OF GOVERNMENT PRINTING



වාර්ෂික කාර්ය සාධන වාර්තාව
2022

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
කොළඹ 08

H 058572 - 20 (2023/05) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව





රජයේ මුද්‍රණාලයාධිපතිතුමියගේ පණිවුඩය

2022 වර්ෂය ශ්‍රී ලංකාවට මෙන්ම සමස්ත ලෝකයටම අභියෝග සහිත වූ වර්ෂයකි. ඒ 2021 හා 2022 වර්ෂයන්හි ගෝලීය වශයෙන් පැතිර ගිය කෝවිඩ් -19 වසංගත තත්ත්වය ක්‍රමයෙන් වියැකී යාම හමුවේ පෙර අඩපණව තිබූ ආර්ථික, සාමාජීය ක්‍රියාවලීන් ඇතුළු සියලුම සාර්ව ආර්ථික පරිසර තත්ත්වයන් යථා තත්ත්වයට පත් කර ගැනීමට දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදු වූ වසරක් වූ නිසාවෙනි. එවැනි පසුබිමක් තුළ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට ද ආයතනික කටයුතු යථා තත්ත්වයට පත් කර ගැනීම පිණිස අතිරේක පරිශ්‍රමයක් දැරීමට සිදු විය. කෝවිඩ් - 19 වසංගත තත්ත්වය ව්‍යාප්ත වූ කාල සීමාවේ සෞඛ්‍ය මාර්ගෝපදේශ, නිරෝධායන ඇඳිරි නීතිය පැනවීම, සංචරණ සීමා පැනවීම, රාජකාරී අත්‍යවශ්‍ය සේවාවන්ට පමණක් සීමා වීම ආදී හේතූන් මත සීමා සහිතව පැවති මුද්‍රණ කාර්යයන් 2022 වර්ෂයේ දී රට සාමාන්‍ය පරිදි විවෘත කිරීමත් සමඟ යථා පරිදි ලැබීමට ආරම්භ වූ අතර සීමා සහිත වූ කාල සීමාවේ ඉටු කිරීමට නොහැකි වූ හෝ කල් තැබුණු කාර්යයන් සඳහා ඇණවුම් ලැබීමත් සමඟ ආයතනය දැඩි කාර්ය බහුල තත්ත්වයකට පත්විය. එමෙන්ම ආයතනික, පරිපාලන, මූල්‍ය හා විගණන අංශයන්හි ද කටයුතු යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා දැඩි වෙහෙසක් දැරීමට සිදුවිය.

විශේෂයෙන්ම මෙම වර්ෂය තුළ, නිෂ්පාදන ආයතනයක් වශයෙන් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට මුහුණදීමට සිදු වූ තවත් ප්‍රධාන අභියෝගයක් වූයේ මුද්‍රණ නිෂ්පාදන අමුද්‍රව්‍යයන්හි මිල ගණන් සීඝ්‍ර වශයෙන් ඉහළ යාම හා ඒ මත ඇති වූ ගැටළුකාරී තත්ත්වයන්ට මුහුණදීමට සිදුවීමයි. ඒ අනුව, මුද්‍රණය සඳහා යොදා ගනු ලබන කඩදාසි, තීන්ත, ටෝනර් ඇතුළු අමුද්‍රව්‍යයන්හි මිල ගණන් පැවති මිල ගණන්වලට සාපේක්ෂව සිව් ගුණයකින් පමණ ඉහළ යාම හේතුවෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ යාම පාලනය කළ නොහැකි තත්ත්වයක් විය. අමුද්‍රව්‍ය ඇතුළු භාණ්ඩ හා සේවාවන්හි වෙළෙඳපල මිල ගණන් සීඝ්‍ර ලෙස ඉහළ යාම හේතුවෙන් වෙන් කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ අතර සීමිත ප්‍රතිපාදනයන්ට අදාළව අක්මුදල් ලබා දීම ද සීමා සහිත විය. එමෙන්ම, රට තුළ දැඩිව පැවති විදේශ විනිමය අර්බුදය හේතුවෙන් මුද්‍රණ අමුද්‍රව්‍ය ආනයනය ද සීමා විය. කෙසේ වුව ද, මෙම සියලු තත්ත්වයන් හමුවේ අපහසුතා මධ්‍යයේ වුව ද අමුද්‍රව්‍ය සපයා ගනිමින් රජයේ අත්‍යවශ්‍ය, හදිසි හා රහස්‍ය මුද්‍රණ කටයුතු ඇතුළු සියලුම රාජ්‍ය මුද්‍රණ අවශ්‍යතාවයන් සපුරාලීමට මෙම දෙපාර්තමේන්තුවට හැකියාව ලැබිණ.

තව ද, රට තුළ පැවති ඉන්ධන අර්බුධය හමුවේ 2022 වර්ෂයේ තෙවන කාර්තුව වන විට ආයතනයන් සේවා මුර ක්‍රමවේදයන් යටතේ ක්‍රියාත්මකව පවත්වා ගැනීමට හා රාජ්‍ය ආයතනයන්හි අති බහුතරයකට නිවසේ සිට රාජකාරී ඉටු කිරීම යන ක්‍රමවේදය ඔස්සේ තම සේවාවන් සැපයීමට සිදුවිය. මෙම කාලය තුළ ද අත්‍යවශ්‍ය මුද්‍රණ කාර්යයන් ඉටුකර දීමට මෙන්ම අත්‍යවශ්‍ය ගැසට් පත්‍ර ප්‍රකාශයට පත් කිරීම සඳහා ද රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව ක්‍රියාකාරීව පවත්වාගෙන යාමේ දැඩි අභියෝගයට මුහුණ දීමට සිදු වූ බව මෙහිලා සඳහන් කළ යුතුය. මෙහි දී නිවසේ සිට රාජකාරී ඉටු කිරීමේ ක්‍රමවේදයට මෙම දෙපාර්තමේන්තුව මහින් සැපයිය යුතු සේවාව සැපයිය නොහැකි වූ අතර, ප්‍රවාහන අපහසුතා මධ්‍යයේ වුව ද සේවයට වාර්තා කර කලට වේලාවට මුද්‍රණ නිමැවුම් ලබා දීමට කාර්ය මණ්ඩලය සමත් විය.

ඉහතින් පැහැදිලි කළ පසුබිම යටතේ වුව ද රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙතින් අපේක්ෂිත සේවය නොපිරිහෙළා, එමෙන්ම කිසිදු අවස්ථාවක රජය අපහසුතාවයට පත් නොවන පරිදි සැපයීමට හැකියාව ලැබීම සම්බන්ධව මෙහි දී අප අතිශයින් සතුටු වෙමු. රජයේ අවශ්‍යතා ඉටු කරමින් මහජනතාවට මනා සන්නිවේදන සේවාවක් පවත්වා ගනිමින් මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ඉහළ මට්ටමක පවත්වාගෙන යාමට ලැබීම සම්බන්ධයෙන් දැඩි සේ සතුටට පත් වන අතර, එම ජයග්‍රහණය ලබා ගැනීමට තම සේවය දෙපාර්තමේන්තුව වෙනුවෙන් ඉටුකළ කාර්ය මණ්ඩලයටත් අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් සිදු කළ ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙතත් මාගේ ගෞරව පූර්වක ස්තූතිය මෙහි දී පුද කරමි.

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම :- රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය :- 211

අන්තර්ගතය *පිටු අංක*

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය **01-06**

1.1 හැඳින්වීම 01

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 02

1.3 ප්‍රධාන කාර්යයන් 02

1.4 සංවිධාන සටහන 04

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 05

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල් 06

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 06

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම **07**

විශේෂ, ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක 07

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය **08-20**

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 08

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 09

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 10

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 11

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 12

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 12

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 13-19

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 20

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 20

පිටු අංක

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක 21

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 21

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 22-25

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු 22-23

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 24-25

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ 26-27

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 26

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම 26

6.3 මානව සම්පත් සංවර්ධනය 26-27

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව 28 - 38

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ජනරජයේ සියලුම රහස්‍ය මුද්‍රණ අවශ්‍යතා සපුරාලීමේ ප්‍රමුඛතම අපේක්ෂාව පෙරදැරි කරගෙන සියලුම රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ වෙමින් නවීන තාක්ෂණික මෙවලම් ඔස්සේ සීඝ්‍රයෙන් වෙනස් වන ලෝකය හා සමගාමී ගමනක නිරත වන රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් ඉහළ ගුණාත්මක භාවයකින් යුතු මුද්‍රණ නිමැවුම් එළි දක්වනු ලබයි.

ගැසට් පත්‍ර, පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තා, පනත් කෙටුම්පත්, දෙපාර්තමේන්තු රෙගුලාසි ආදිය මුද්‍රණය කොට ප්‍රසිද්ධ කිරීමේ ප්‍රමුඛ කාර්යභාරයට අමතරව අණ පනත්, රෙගුලාසි, රජයේ සියලුම පොදු ආකෘතිපත්‍ර, විවිධ අමාත්‍යාංශ සඳහා අවශ්‍ය ආකෘතිපත්‍ර, භාණ්ඩාගාර අයවැය ඇස්තමේන්තු ආදිය මුද්‍රණය කිරීමේ වාණිජ නොවන මුද්‍රණ කටයුතුවල මෙන්ම ආකෘති පත්‍ර, ප්‍රවේශ පත්‍ර, පාසල් පෙළපොත්, දහම් පාසල් පොත්, මැතිවරණ දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය ආකෘති වර්ග, ඡන්ද පත්‍රිකා, විචල්‍ය දත්ත මුද්‍රණය, රජයේ විවිධ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු සඳහා වන වාර්ෂික වාර්තා සහ කාර්ය සාධන වාර්තා මුද්‍රණය, ලොතරැයි මුද්‍රණය කිරීම් ආදී වාණිජ මුද්‍රණ කටයුතුවල ද මෙම දෙපාර්තමේන්තුව නිරතව සිටී. මෙයට අමතරව පළාත් සභා, පළාත් පාලන ආයතන මෙන්ම අර්ධ රාජ්‍ය ආයතනවල කටයුතු පහසු කරවනු වස් අන්තර්ජාලය හරහා සෘජුවම ගැසට් පත්‍ර මඟින් තොරතුරු සන්නිවේදනය කිරීම ද රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

වර්තමානය වන විට අන්තර්ජාලය ඔස්සේ, www.documents.gov.lk වෙබ් අඩවියට පිවිස අවශ්‍ය තොරතුරු ඉක්මනින් ලබා ගැනීමේ තාක්ෂණික ක්‍රමවේදය අනුගමනය කරමින් නොනිමි මෙහෙවරක් ප්‍රශස්ත මට්ටමින් ඉටු කරනු ලැබේ. වර්තමානයේ රජයේ මුද්‍රණාලයාධිපති ලෙස කටයුතු කරන ගංගානි ලියනගේ මහත්මියගේ මග පෙන්වීම යටතේ 1215 ක කාර්ය මණ්ඩලයක් කාර්යක්ෂමව තම සේවය නිරන්තරව ලබා දීමට කැප වී සිටී.

2020 හා 2021 වර්ෂයන්හි පැවති කොවිඩ් 19 වසංගත ව්‍යාප්ති තත්ත්වයේ බලපෑම හමුවේ ආයතනික ක්‍රියාවලීන් යථා තත්ත්වයට පත් කර ගැනීමත්, රටෙහි පැවති දැඩි ආර්ථික හා විදේශ විනිමය අර්බුදය හමුවේ රාජ්‍ය ආයතනයක් වශයෙන් ආයතනයේ භෞතික හා මූල්‍ය සම්පත් මනාව කළමනාකරණය කර ගැනීමත් සිදු කරමින් රජයට අවශ්‍ය අත්‍යවශ්‍ය මුද්‍රණ සේවා සැපයීමට මෙම දෙපාර්තමේන්තුවට හැකි විය.

තිරසර සංවර්ධන පනත යටතේ මුල් අදියර වශයෙන් වසර 2025 වන විට රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් ළඟා කර ගත යුතු ඉලක්ක කරා යාමේ පියවරයන්හි අඩිතාලම හඳුනා ගෙන ඇති අතර ආරක්ෂිත මුද්‍රණ ක්‍රමවේදයන් වැඩි දියුණු කර ශ්‍රී ලංකා ජනරජයේ සියලුම රහස්‍ය මුද්‍රණ අවශ්‍යතා සපුරාලීම රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතම අපේක්ෂාවයි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.2.1 ආයතනයේ දැක්ම :

"මුද්‍රණයේ හා ප්‍රකාශනයේ ජීවනාලිය බවට පත්වීම"

1.2.2 මෙහෙවර :

"කෘතහස්ත කාර්ය මණ්ඩලය නවීන තාක්ෂණය උපයෝගී කරගෙන කලට වේලාවට ගුණාත්මක නිමාවකින් යුතුව සේවාලාභීන් තෘප්තිමත් වන අයුරින් මුද්‍රණ හා ප්‍රකාශන සේවා සැපයීම"

1.2.3 අරමුණු :

- මුද්‍රණ හා ප්‍රකාශන සේවා කටයුතු උසස් නිමාවකින් සහ නිරවද්‍යතාවයෙන් යුතුව කලට වේලාවට ඉටු කර දීම
- මුද්‍රණ කටයුතුවල ගුණාත්මකභාවය, නිමාව සහ නිර්මාණශීලීත්වය ඉහළ නැංවීම
- නවීන තාක්ෂණය සහ ක්‍රමවේදයන් වර්ධනය කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ ඵලදායිතාවය නැංවීම
- රජයේ සියලුම ප්‍රකාශන පහසු මිලට හා කාර්යක්ෂම ලෙස මහජනතාවට මිල දී ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම
- කළමනාකරණ පද්ධතිය හා ක්‍රියාපටිපාටීන් වැඩි දියුණු කිරීම මඟින්, ගනුදෙනුකරුවන්ට උසස් සේවාවක් සැපයීම
- මානව සම්පත් සංවර්ධනය තුළින් ආකල්පමය වෙනසක් ඇති කිරීම හා එමඟින් සේවාලාභීන් තෘප්තිමත් වන අයුරින් උසස් සේවාවක් සැපයීම
- සේවක ආරක්ෂාව හා සුබසාධනය ඉහළ නැංවීම
- දෙපාර්තමේන්තුව තුළ ප්‍රියමනාප වැඩ පරිසරයක් නිර්මාණය කිරීම තුළින් පාරිභෝගිකයන් තෘප්තිමත් වන ආකාරයේ උසස් සේවාවක් ලබා දීම
- නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සහ අධිකරණ ක්‍රියාදාමයන් සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම
- ආරක්ෂිත මුද්‍රණය පිළිබඳ මහජන විශ්වාසය ගොඩනැගීම

1.3 ප්‍රධාන කාර්යයන්

- රජයේ ගැසට් පත්‍ර, පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තා, පනත් කෙටුම්පත්, දෙපාර්තමේන්තු රෙගුලාසි ආදිය මුද්‍රණය කර ප්‍රසිද්ධ කිරීම
- අණ පණත්, රෙගුලාසි, විවිධ අමාත්‍යාංශ සඳහා අවශ්‍ය පෝරම, භාණ්ඩාගාර අයවැය ඇස්තමේන්තු ආදිය මුද්‍රණය කිරීමේ වාණිජ නොවන මුද්‍රණ කටයුතු ඉටු කිරීම

- මුද්දර, ආකෘතිපත්‍ර, ප්‍රවේශපත්‍ර, පාසල් පෙළපොත්, දහම් පාසල් පොත්, මැතිවරණ දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය සියලුම පෝරම වර්ග, රජයේ විවිධ අමාත්‍යාංශ සඳහා වන වාර්ෂික වාර්තා සහ කාර්ය සාධන වාර්තා මුද්‍රණය කිරීමේ වාණිජ මුද්‍රණ කටයුතු ඉටු කිරීම
- පළාත් සභා, පළාත් පාලන ආයතන සහ අර්ධ රාජ්‍ය ආයතනවලට අවශ්‍ය මුද්‍රණ හා ප්‍රකාශන සේවා සැපයීම
- විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය හරහා ජනතාවට සෘජුවම තොරතුරු කලට වේලාවට ගුණාත්මක නිමාවකින් යුතුව සැපයීම
- අනෙකුත් මුද්‍රණ හා ප්‍රකාශන සේවා සැපයීම

1.4 සංවිධාන සටහන



රජයේ මුද්‍රණාලයාධිපති ශ්‍රී. ලං. මු. සේ. (විශේෂ)
අතිරේක රජයේ මුද්‍රණාලයාධිපති (පෙර මුද්‍රණ) ශ්‍රීලං.මු.සේ. (විශේෂ)
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රජයේ මුද්‍රණාලයාධිපති (තොරතුරු තාක්ෂණ) ශ්‍රී ලං.මු.සේ. I)
නි.ර.මු. / ස.ර.මු. (මල්ටිමීඩියා) ශ්‍රී ලං.මු.සේ. II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු. / ස.ර.මු. (ඉලෙක්ට්‍රොනික I) ශ්‍රී ලං.මු.සේ. . II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු. / ස.ර.මු. (ඉලෙක්ට්‍රොනික II) ශ්‍රී ලං.මු.සේ. . II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු. / ස.ර.මු. (පරිගණක) ශ්‍රී ලං.මු.සේ. . II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි (I)
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රජයේ මුද්‍රණාලයාධිපති (පෙර මුද්‍රණ) ශ්‍රී ලං.මු.සේ. I)
නි.ර.මු./ස.ර.මු. (ප්‍රගතිපාලන හා මිල කිරීම්) ශ්‍රී ලං.මු.සේ. . II/II)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු. / ස.ර.මු. (මුද්‍රණ සංස්කාරක) (දිවා) ශ්‍රී ලං.මු.සේ. . II/II)
ප්‍රධාන මුද්‍රණ සංස්කාරක
සහකාර ප්‍රධාන මුද්‍රණ සංස්කාරක
නි.ර.මු. / ස.ර.මු. (මුද්‍රණ සංස්කාරක) (රාත්‍රී) ශ්‍රී ලං.මු.සේ. . II/II)
ප්‍රධාන මුද්‍රණ සංස්කාරක
සහකාර ප්‍රධාන මුද්‍රණ සංස්කාරක
අතිරේක රජයේ මුද්‍රණාලයාධිපති (නිෂ්පාදන/මෙහෙයුම්) ශ්‍රීලං.මු.සේ. (විශේෂ)
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රජයේ මුද්‍රණාලයාධිපති (නිෂ්පාදන) ශ්‍රී ලං.මු.සේ. I)
නි.ර.මු. / ස.ර.මු. (යන්ත්‍ර I) ශ්‍රී ලං.මු.සේ. . II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු. / ස.ර.මු. (යන්ත්‍ර II) ශ්‍රී ලං.මු.සේ. . II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු. / ස.ර.මු. (මුද්‍රණ නිමැවුම් I) ශ්‍රීලං.මු.සේ. . II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු. / ස.ර.මු. (මුද්‍රණ නිමැවුම් II) ශ්‍රී ලං.මු.සේ. . II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු. / ස.ර.මු. (රහස් I) ශ්‍රී ලං.මු.සේ. . II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු. / ස.ර.මු. (රහස් II) ශ්‍රී ලං.මු.සේ. . II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රජයේ මුද්‍රණාලයාධිපති (මෙහෙයුම්) ශ්‍රී ලං.මු.සේ. I)
නි.ර.මු. / ස.ර.මු. ආදායම් සහ බෙදාහැරීම්
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු. / ස.ර.මු. (මුද්‍රණ කාර්මික) ශ්‍රී ලං.මු.සේ. . II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු./ස.ර.මු. (මුද්‍රණ සැපයීම් - දේශීය)
අංශ ප්‍රධානී (කළ.සේ.නි. I)
නි.ර.මු./ස.ර.මු. (මුද්‍රණ සැපයීම් - විදේශීය)
අංශ ප්‍රධානී (කළ.සේ.නි. I)
නි.ර.මු./ස.ර.මු. (විවිධ සැපයීම්) ශ්‍රී ලං.මු.සේ. II/III)
අංශ ප්‍රධානී (කළ.සේ.නි. I)
නි.ර.මු./ස.ර.මු. (නාරාහේන්පිට) ශ්‍රීලං.මු.සේ. II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු./ස.ර.මු. (රාත්‍රී) ශ්‍රී ලං.මු.සේ. II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
අතිරේක රජයේ මුද්‍රණාලයාධිපති (පාලන) ශ්‍රීලං.ප.සේ. (විශේෂ)
නි.ර.මු./ස.ර.මු. (ආයතන) ශ්‍රී ලං.ප.සේ. II/III)
පරිපාලන නිලධාරි I කළ.සේ.නි. (අධි පන්තිය)
අංශ ප්‍රධානී (කළ.සේ.නි. I)
පරිපාලන නිලධාරි II කළ.සේ.නි. (අධි පන්තිය)
අංශ ප්‍රධානී (කළ.සේ.නි. I)
නි.ර.මු./ස.ර.මු. (පාලන) ශ්‍රී ලං.ප.සේ. II/III)
පරිපාලන නිලධාරි III කළ.සේ.නි. (අධි පන්තිය)
අංශ ප්‍රධානී (කළ.සේ.නි. I)
පරිපාලන නිලධාරි IV කළ.සේ.නි. (අධි පන්තිය)
අංශ ප්‍රධානී (කළ.සේ.නි. I)
ප්‍රධාන ගණකාධිකාරි (ශ්‍රී ලං.ග.සේ.I)
ගණකාධිකාරි (වැටුප් හා ණය අත්තිකාරම්) ශ්‍රී ලං.ග.සේ. II/III)
අංශ ප්‍රධානී (කළ.සේ.නි. I)
ගණකාධිකාරි (ගෙවීම්) ශ්‍රී ලං.ග.සේ. II/III)
අංශ ප්‍රධානී (කළ.සේ.නි. I)
ගණකාධිකාරි (ආදායම් හා තොග පාලන) ශ්‍රී ලං.ග.සේ. II/III)
අංශ ප්‍රධානී (කළ.සේ.නි. I)
ප්‍රධාන අභ්‍යන්තර විගණක (ශ්‍රී ලං.ග.සේ.I)
අංශ ප්‍රධානී (කළ.සේ.නි. I)
නීති නිලධාරි

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1.5.1 නිෂ්පාදන, සැලසුම් හා මෙහෙයුම් අංශය

දෙපාර්තමේන්තුවට ලැබෙන සියලුම මුද්‍රණ ඇණවුම් සඳහා වැඩ විස්තරපත් නිකුත් කිරීම, මිල ඇස්තමේන්තු ලබා දීම, මුද්‍රණ කාර්යයන්ට අදාළ පිරිවැය ගණනය කිරීම මෙන්ම බිල්පත් නිකුත් කිරීම හා මුද්‍රණ, පෙර මුද්‍රණ කටයුතු මෙමඟින් ඉටු කරනු ලැබේ. ඒ සඳහා මෙම අංශය යටතේ වැඩ විස්තර පත්‍ර නිකුත් කිරීම්, මිල කිරීම්, නිෂ්පාදන මෙහෙයුම්, මල්ටිමීඩියා, කඩදාසි ගබඩා හා ඉංජිනේරු ගබඩා යන අංශ පවතී.

1.5.2 රහස්‍ය අංශය

ආයතනයට ලැබෙන සියලු රහස්‍ය මුද්‍රණ කටයුතු ඉටු කරනු ලබන්නේ මෙම අංශය මඟිනි. මුද්දර, රහස්‍ය හදිසි පනත් හා ගැසට් පත්‍ර, විභාග ප්‍රශ්න පත්‍ර, දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර මෙන්ම අනෙකුත් රහස්‍ය මුද්‍රණ කටයුතු මෙම අංශය මඟින් ඉටු වේ. රහස්‍ය අංශය යටතේ ලිතෝ යන්ත්‍ර අංශය, රහස් මුද්දර අංශය, ඩිජිටල් අංශය, රහස් කියවීම් අංශය, රහස් පොත් බැඳීම් අංශය, හරි වැරදි බැලීම් අංශය, රහස් පරිගණක අංශය ආදී අංශ ක්‍රියාත්මක වේ.

1.5.3 පෙර මුද්‍රණ අංශය

මුද්‍රණයට අවශ්‍ය සියලුම පෙර මුද්‍රණ කටයුතු මෙමඟින් ඉටු වේ. ඒ අනුව පරිගණක පිටු සැකසීම, මුද්‍රණයට අවශ්‍ය පොලිමර් මෙන්ම ප්ලේට්ස් සැකසීම මෙම අංශය මඟින් ඉටු කරනු ලබයි. පරිගණක අංශ, කියවීම් අංශ, මුද්‍රණ තහඩු නිෂ්පාදන අංශ මේ යටතේ ක්‍රියාත්මක වේ.

1.5.4 මුද්‍රණ අංශය

ලැබෙන මුද්‍රණ කටයුතු විශාල ප්‍රමාණයක් මුද්‍රණය කිරීම සිදු කරනු ලබන්නේ මෙම අංශය මඟිනි. මෙම අංශය මඟින් ඡන්ද පත්‍රිකා, රජයේ ආයතනයන්හි භාවිතා කරන පොදු ආකෘති, ගැසට්, පාසල් පොත්, දහම් පාසල් පොත් හා අනෙකුත් මුද්‍රණ කටයුතු සිදු කරන අතර මේ සඳහා වෙබ් අංශය, රොටරි අංශය, කෝඩ් අංශය, සෝඩ් අංශය, ලෙටර් ප්‍රෙස් අංශය යන අංශ පවතී.

1.5.5 පොත් බැඳුම් අංශය

පාරිභෝගිකයාගේ අවශ්‍යතාවය පරිදි මුද්‍රණය කළ හෝ නොකළ කඩදාසි, ලේඛන, පාරිභෝගික පරිහරණයට හා කල් පැවැත්මට පහසු වන ආකාරයට ශිල්පීය ක්‍රම අනුගමනය කරමින් ඒකරාශි කොට බැඳීම හා බැඳීම් කරන ලද පොත් සිත් ගන්නා ලෙස එහි වටිනාකම රඳවන පරිදි නිමාකරණය කිරීම පොත් බැඳීම් අංශයේ ක්‍රියාවලිය වේ. මේ යටතේ, තාක්ෂණයෙන් උසස් නිමවුම්, සාමාන්‍ය හදිසි, හරි වැරදි බැලීම්, නැවත බැඳීම්, පාසල් පොත්, සාමාන්‍ය හදිසි නිමවුම් (P.S), නව ගැදරින් යන කාර්යයන් ඉටු කරනු ලබයි.

1.5.6 බෙදා හැරීම් අංශය

සියලුම මුද්‍රණ නිමැවුම් අදාළ ආයතනයන් වෙත බෙදා හැරීම මෙම අංශයේ ප්‍රමුඛ කාර්යය වේ. මෙයට අතිරේකව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, මුදල් රෙගුලාසි සංග්‍රහය, ආයතන සංග්‍රහය, අපරාධ නඩු විධි විධාන සංග්‍රහය, දණ්ඩනීති සංග්‍රහය වැනි ලේඛන හා තොරතුරු දැන ගැනීමේ පනත් ආදිය ප්‍රකාශන පියස

මඟින් සහන මිලට අලෙවි කරනු ලැබේ. විවිධ බෙදා හැරීම් අංශය, පෝරම ගබඩා අංශය, ගැසට් බෙදා හැරීම් අංශය හා ප්‍රකාශන පියස මේ යටතේ ක්‍රියාත්මක වේ.

1.5.7 පරිපාලන අංශය

ආයතනයේ සියලු පරිපාලන කටයුතු සිදු කරනු ලබන්නේ පරිපාලන අංශය මඟිනි. මෙම අංශයෙහි කටයුතු ප්‍රධාන වශයෙන් ආයතන හා පාලන ලෙස අංශ දෙකක් යටතේ සිදු කරනු ලැබේ. ආයතන අංශය යටතේ මානව සම්පත්, ආයතන යන අංශත් පාලන අංශය යටතේ තැපැල්, විශ්‍රාම වැටුප්, කාලගණක, ආයතන ණය, යන අංශත් පවත්වාගෙන යනු ලැබේ. මානව සම්පත් කළමනාකරණයට අදාළ සියලු කටයුතු, නඩත්තු හා මෙහෙයුම් ඇතුළු සියලු පරිපාලන කටයුතු සිදු කරමින් ආයතනයේ වෘත්තීය කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය පරිපාලනමය පසුබිම සකස් කර දීම මෙම අංශයෙන් සිදු වේ.

1.5.8 මූල්‍ය අංශය

ආයතනයේ සියලු මූල්‍ය කටයුතු මෙහෙයවීම සිදු කරනු ලබනුයේ මෙම අංශය මඟිනි. ඒ අනුව මෙම අංශයෙහි කටයුතු ප්‍රධාන වශයෙන් වැටුප්, ණය අත්තිකාරම්, ආදායම්, ගෙවීම් හා තොග පාලන වශයෙන් අංශ 5 ක් යටතේ ක්‍රියාත්මක වේ. ආයතනයේ ගිණුම්, වැටුප් හා ණය අත්තිකාරම්, ආදායම්, ගෙවීම් හා තොග පාලන රාජකාරී ඉටු කරමින් වෘත්තීය කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය මූල්‍යමය පසුබිම සකස් කර දීම මෙම අංශයෙන් සිදු වේ.

1.5.9. අභ්‍යන්තර විගණන අංශය

මුදල් රෙගුලාසි 133 හා 2018 අංක 19 දරන විගණන පනතේ 40 හා 41 හා විධිවිධානවලින් ලැබී ඇති බලතල පරිදි දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලන ක්‍රමයට සහභාගී වී එම කටයුතු වල වැරදි හා වංචා වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳ අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයීමක් පවත්වාගෙන යාමේ පරමාර්ථයෙන් විගණන කාර්යයන් ඉටු කිරීම අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කරනු ලැබේ.

1.5.10 නිෂ්පාදනයට සෘජු දායකත්වයක් සපයන අංශ

ප්‍රධාන මුද්‍රණ අමුද්‍රව්‍ය වන කඩදාසි ඇතුළු ආයතනයට අවශ්‍ය සියලුම දේශීය විදේශීය සැපයීම්, යන්ත්‍රෝපකරණ නඩත්තු ඇතුළු රාජකාරී මෙමඟින් ඉටු කරනු ලබයි. මේ යටතේ දේශීය සැපයුම් අංශය, විදේශීය සැපයුම් අංශය, වෙනත් සැපයුම් අංශය, ප්‍රවාහන අංශය, ආරක්ෂක අංශය, සුභසාධන අංශය යන අංශ ක්‍රියාත්මක වේ.

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන/ අරමුදල්

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව යටතේ ආයතන/ අරමුදල් නොමැත.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙහි විදේශ ආධාර ලබන ව්‍යාපෘති ක්‍රියාත්මක නොවේ.

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ, ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

- 2020 හා 2021 වර්ෂයන්හි පැවති කොවිඩ් 19 වසංගත ව්‍යාප්ති තත්ත්වයේ බලපෑම හමුවේ ආයතනික ක්‍රියාවලීන් යථා තත්ත්වයට පත් කර ගැනීමත්, රටෙහි පැවති දැඩි ආර්ථික හා විදේශ විනිමය අර්බුදය හමුවේ රාජ්‍ය ආයතනයක් වශයෙන් ආයතනයේ භෞතික හා සීමා සහිත වූ මූල්‍ය සම්පත් මනාව කළමනාකරණය කර ගැනීමත් සිදු කර ගනිමින් රජය අපහසුතාවයට පත් නොවන ආකාරයට ආයතනික ඉලක්ක ඉටු කර ගැනීම 2022 වර්ෂය තුළ ප්‍රධානම අභියෝගය විය.

- මෙම අභියෝගයට සාර්ථකව මුහුණ දෙමින් 2022 වර්ෂයේ සියලු අත්‍යවශ්‍ය, හදිසි හා රහස්‍ය මුද්‍රණ කාර්යයන් නියමිත වේලාවට ඉටු කර දීම අප ලැබූ විශේෂ ජයග්‍රහණයක් ලෙස දැක්විය හැක.

- නූතන ඩිජිටල් තාක්ෂණයත් සමග ඉතා සීඝ්‍රයෙන් වෙනස් වන ක්ෂේත්‍රයක් වන මුද්‍රණ ක්ෂේත්‍රය තුළ පූර්ණ රාජ්‍ය ආයතනයක් වශයෙන් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව අබියස පවතින ප්‍රමුඛතම අභියෝගය වන්නේ මෙම සීඝ්‍රයෙන් වෙනස් වන තාක්ෂණික පරිසරයට අනුගත වන පරිදි එහි නිෂ්පාදන ක්‍රියාවලිය සකස් කර ගැනීමයි. ඒ අනුව, ශ්‍රී ලංකාව තුළ රහස්‍ය මුද්‍රණ කාර්යයන් ඉටු කිරීමේ ප්‍රමුඛයා බවට පත්වීමේ ඉලක්කය පෙරදැරිව දෙපාර්තමේන්තුවේ ඉදිරි සැලසුම් සකස් කොට ඇත. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයන්ට අනුකූල වන පරිදි හා තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම අරමුණු කොට ගෙන මෙම දෙපාර්තමේන්තුව සැලසුම් සකස් කොට ඇති අතර, ඊට අනුගතව වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කරමින් අදාළ ඉලක්කගත අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස විධිමත් ක්‍රියාවලියක් ආරම්භ කොට ඇත. මේ යටතේ 2025 වර්ෂය අවසානය වන විට ශ්‍රී ලංකාව තුළ රහස්‍ය මුද්‍රණ කාර්යයන් ඉටු කිරීමේ ප්‍රමුඛතම ආයතනය බවට පත්වීමත් ශ්‍රී ලංකා ජනරජයේ සියලුම රහස්‍ය මුද්‍රණ අවශ්‍යතාවයන් සපුරාලීමත් දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතම ඉලක්කය වේ.

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

එස්ඒ - එෆ්

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන
මූල්‍ය කාර්ය සාධනය

අයවැය 2022

	සටහන	තක්‍ය වර්තමාන වර්ෂය 2022 (රු.)	තක්‍ය ඉකුත් වර්ෂය 2021 (රු.)	
ආදායම් ලැබීම්				
ආදායම් බදු	1	-	-	
දේශීය භාණ්ඩ හා සේවා බදු	2	-	-	එස්ඒ-1
ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
බදු නොවන ආදායම් හා වෙනත්	4	928,554,128	756,670,731	
මුළු ආදායම් ලැබීම් (අ)		**928,554,128**	**756,670,731**	
ආදායම් නොවන ලැබීම්				
භාණ්ඩාගාර අග්‍රිම		2,723,005,000	2,484,685,000	එස්ඒ-3
තැන්පතු		174,092,712	338,681,977	එස්ඒ-4
අත්තිකාරම් ගිණුම්		68,816,339	74,204,866	එස්ඒ-5
වෙනත් ලැබීම්		70,449,499	43,522,036	
මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**3,036,363,550**	**2,941,093,879**	
මුළු ආදායම් ලැබීම් හා මුළු ආදායම් නොවන ලැබීම් (ඇ)=(අ)+(ආ)		**3,964,917,678**	**3,697,764,610**	
භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		269,000,107	9,936	
ශුද්ධ ආදායම් ලැබීම් හා මුළු ආදායම් නොවන ලැබීම් (ඉ)=(ඇ)-(ඈ)		**3,695,917,571**	**3,697,754,674**	
අඩුකළා : වියදම්				
පුනරාවර්තන වියදම්				
වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	1,624,272,741	1,450,478,637	
අනෙකුත් භාණ්ඩ හා සේවා	6	1,435,860,395	1,519,666,669	
සහනාධාර ප්‍රදාන හා මාරුකිරීම්	7	5,887,565	6,150,586	එස්ඒ-2(ii)
පොලී ගෙවීම්	8	-	-	
වෙනත් පුනරාවර්තන වියදම්	9	20,970	1,749,621	
මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**3,066,041,671**	**2,978,045,513**	
මූලධන වියදම්				
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	10	56,164,291	59,657,528	
මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	39,836,772	126,147,194	
ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	1,938,870	
මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	එස්ඒ-2(ii)
හැකියා වර්ධනය	14	2,396,000	-	
වෙනත් මූලධන වියදම්	15	-	-	
මුළු මූලධන වියදම් (උ)		**98,397,063**	**187,743,592**	
තැන්පතු ගෙවීම		370,912,041	198,481,696	එස්ඒ-4
අත්තිකාරම් ගෙවීම		35,466,909	69,906,013	එස්ඒ-5
වෙනත් ගෙවීම්		112,079,266	36,207,167	
ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**518,458,216**	**304,594,876**	
මුළු වියදම් (එ)= (ඊ+උ+ඌ)		**3,682,896,950**	**3,470,383,981**	
දෙසැම්බර් 31 දිනට ශේෂය (ඒ) =(ඉ-එ)		**13,020,621**	**227,370,693**	
අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**13,020,621**	**227,370,693**	එස්ඒ-7
දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	එස්ඒ-3
		-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ACA - P

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
		වර්තමාන වර්ෂය	ඉකුත් වර්ෂය
		2022 (රු.)	2021 (රු.)
මූල්‍ය නොවන වත්කම්			
දේපල පිරියත හා උපකරණ	ඒසිඒ-6	1,359,122,484	1,322,195,498
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	196,666,797	230,016,227
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
වැටි බදු පාලන ගිණුම		41,997,251	367,482
මුළු වත්කම්		**1,597,786,532**	**1,552,579,207**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		133,864,109	(71,235,559)
දේපල පිරියත හා උපකරණ සංචිතය		1,359,122,484	1,322,195,498
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම	ඒසිඒ-4	104,799,939	301,619,268
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**1,597,786,532**	**1,552,579,207**

පිටු අංක 01 සිට 26 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු හා ඇමුණුම් පිටු අංක 27 සිට 46 දක්වා ඇතුළත් අනෙකුත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි ම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදු කර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙලිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමග එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදු කිරීමට වරින් වර සමාලෝචන සිදු කරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන් දීමේ නිලධාරි	ගණන් දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරී
නම:- අනූෂ පැල්පිට	නම:- ජී. කේ. ඩී. ලියනගේ	නම:- එම්.ඩී.ප්‍රියලාල් පීරිස්
තනතුර:- ලේකම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය	තනතුර:- රජයේ මුද්‍රණාලයාධිපති	තනතුර:- ප්‍රධාන ගණකාධිකාරී
දිනය:- 2023.05.	දිනය:- 2023.05.	දිනය:- 2023.05.

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන
මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

තක්‍ය

	වර්තමාන වර්ෂය 2022 (රු.)	ඉකුත් වර්ෂය 2021 (රු.)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්		
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	906,368,699	744,027,760
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	45,292,975	57,360,351
අග්‍රිම ලැබීම්	2,723,005,000	2,484,685,000
අත්තිකාරම් අය කර ගැනීම්	65,245,371	72,631,821
තැන්පත් ලැබීම්	174,092,712	338,681,977
වෙනත් ප්‍රදාන ලෙජර් ගිණුම් ලැබීම්	70,449,498	43,522,036
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**3,984,454,255**	**3,740,908,945**
අඩු කළා - මුදල් වැය කිරීම		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,623,059,356	2,830,791,525
සහනාධාර සහ මාරු කිරීම්	1,305,254,740	7,900,207
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	174,522,365	416,623,191
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	269,000,107	9,936
අත්තිකාරම් ගෙවීම්	35,229,387	68,650,145
තැන්පත් ගෙවීම්	370,912,041	198,481,696
වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්	112,100,237	36,207,167
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**3,890,078,233**	**3,558,663,867**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) =(අ)-(ආ)	94,376,022	182,245,078
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
භිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම	94,376,022	182,245,078
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**94,376,022**	**182,245,078**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) =(ඇ) -(ඉ)	(94,376,022)	(182,245,078)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ) =(ඇ)+(ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම		
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඒ) = (ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

(1) වාර්තාකරණ කාල පරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාල පරිච්ඡේදය වේ.

(2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙළ කිරීම වැඩි දියුණු කළ මුදල් පදනම මත සිදු කරයි. මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

(3) ආදායම් හඳුනා ගැනීම්

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාල සීමාව නොසලකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනා ගනු ලැබේ.

(4) දේපළ,පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

(5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

(6) මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි වලින් සමන්විත වේ.

යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත් කර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙලිදරව් කිරීම ඇතුළත් කළ හැක.

තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තා කිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.03.02.05	රජයේ මුද්‍රණාලයාධිපතිගේ ආදායම	800,000,000.00	800,000,000.00	928,554,128.55	116.07%

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම්	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	3,160,080,000	3,245,000,000	3,066,041,671	94.49%
ප්‍රාග්ධන	288,300,000	145,000,000	98,397,063	67.86%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු. අංකය	ප්‍රතිපාදනය ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	වැය ශීර්ෂය	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම්	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
				මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	පශු සම්පත්, ගොවිපළ ප්‍රවර්ධන, කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය	427-01-02-1201	මුද්‍රණ කටයුතු	52,920.00	52,920.00	52,920.00	100%
2	බදු අභියාචනා කොමිෂන් සභාව	102-01-05-1201	මුද්‍රණ කටයුතු	55,080.00	55,080.00	55,080.00	100%
3	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව	210-01-02-1201	මුද්‍රණ කටයුතු	43,200.00	43,200.00	43,200.00	100%
4	අධිකරණ අමාත්‍යාංශය	110-01-01-0-1201	මුද්‍රණ කටයුතු	112,759.07	112,759.07	112,759.07	100%
5		110-01-05-13-2509	මුද්‍රණ කටයුතු	31,968.00	31,968.00	31,968.00	100%
6		110-01-02-1409(39)	මුද්‍රණ කටයුතු	2,455,400.00	2,455,400.00	2,455,400.00	100%
7		110-01-02-1201	මුද්‍රණ කටයුතු	4,242.00	4,242.00	4,242.00	100%
8		110-01-07-1201	මුද්‍රණ කටයුතු	62,387.50	62,387.50	62,387.50	100%
9		110-01-03-1201	මුද්‍රණ කටයුතු	795,225.00	795,225.00	795,225.00	100%
10	වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	408-01-02-1201	මුද්‍රණ කටයුතු	68,040.00	68,040.00	68,040.00	100%
11	නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය	421-1-3-0-1201	මුද්‍රණ කටයුතු	94,527.00	94,527.00	94,527.00	100%
12	සමූපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය	438-01-02-0-1201	මුද්‍රණ කටයුතු	174,376.80	174,376.80	174,376.80	100%

අනු. අංකය	ප්‍රතිපාදනය ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	වැය ශීර්ෂය	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම්	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
				මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
13	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	249-01-01-0-1201	මුද්‍රණ කටයුතු	135,000.00	135,000.00	135,000.00	100%
14	බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	101-2-6-1409(08)	මුද්‍රණ කටයුතු	73,297.71	73,297.71	73,297.71	100%
15		101-01-02-1201	මුද්‍රණ කටයුතු	373,065.10	373,065.10	373,065.10	100%
16		101-02-05-06-1508	මුද්‍රණ කටයුතු	36,450.00	36,450.00	36,450.00	100%
17		101-02-08-09-2205	මුද්‍රණ කටයුතු	84,240.00	84,240.00	84,240.00	100%
18		101-02-05-1409	මුද්‍රණ කටයුතු	220,110.00	220,110.00	220,110.00	100%
19		101-01-01-0-1201	මුද්‍රණ කටයුතු	86,434.00	86,434.00	86,434.00	100%
20		101-01-08-00-1201	මුද්‍රණ කටයුතු	8,991.00	8,991.00	8,991.00	100%
21	පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව	227-01-01-0-1201-11	මුද්‍රණ කටයුතු	17,403,884.90	17,403,884.90	17,403,884.90	100%
22	සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව	243-1-1-1201	මුද්‍රණ කටයුතු	53,352.00	53,352.00	53,352.00	100%
23	පොලිස් මූලස්ථානය	225-1-1-0-1205	මුද්‍රණ කටයුතු	2,674,751.75	2,674,751.75	2,674,751.75	100%
24	ජාතික උරුමය, ප්‍රාසාංගික කලා හා ග්‍රාමීය කලා ශිල්ප ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය	401-01-02-1201	මුද්‍රණ කටයුතු	8,991.00	8,991.00	8,991.00	100%
25	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව	010-01-01-1201	මුද්‍රණ කටයුතු	283,581.00	283,581.00	283,581.00	100%
26	ආගමන හා විගමන දෙපාර්තමේන්තුව	226-01-01-1201	මුද්‍රණ කටයුතු	1,281,668.00	1,281,668.00	1,281,668.00	100%

අනු. අංකය	ප්‍රතිපාදනය ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	වැය ශීර්ෂය	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම්	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
				මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
27	ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව	290-01-01-00-1205	මුද්‍රණ කටයුතු	6,052,905.40	6,052,905.40	6,052,905.40	100%
28	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව	238-01-01-1409(24)	මුද්‍රණ කටයුතු	2,080,295.25	2,080,295.25	2,080,295.25	100%
29	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව	281-01-01-1201	මුද්‍රණ කටයුතු	463,897.80	463,897.80	463,897.80	100%
30		281-02-02-1409	මුද්‍රණ කටයුතු	8,806,098.00	8,806,098.00	8,806,098.00	100%
31	සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව	292-01-01-01-2507	මුද්‍රණ කටයුතු	58,860.00	58,860.00	58,860.00	100%
32		292-01-01-2507	මුද්‍රණ කටයුතු	521,126.50	521,126.50	521,126.50	100%
33		292-02-03-05-2507	මුද්‍රණ කටයුතු	2,061,700.00	2,061,700.00	2,061,700.00	100%
34		292-02-03-06-2508	මුද්‍රණ කටයුතු	113,976.20	113,976.20	113,976.20	100%
35		292-01-01-2401	මුද්‍රණ කටයුතු	1,306,630.00	1,306,630.00	1,306,630.00	100%
36		292-02-02-18-2507	මුද්‍රණ කටයුතු	975,415.62	975,415.62	975,415.62	100%
37	බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව	201-02-02-005-1508	මුද්‍රණ කටයුතු	29,537,499.00	29,537,499.00	29,537,499.00	100%
38		201-01-02-1409(007)	මුද්‍රණ කටයුතු	181,090.00	181,090.00	181,090.00	100%
39		201-02-02-1409(013)	මුද්‍රණ කටයුතු	174,528.00	174,528.00	174,528.00	100%
40		201-02-02-1409(11)	මුද්‍රණ කටයුතු	1,090,258.12	1,090,258.12	1,090,258.12	100%
41		201-02-02-1201	මුද්‍රණ කටයුතු	223,100.00	223,100.00	223,100.00	100%
42		201-02-02-1409(015)	මුද්‍රණ කටයුතු	3,721,026.25	3,721,026.25	3,721,026.25	100%
43		201-02-02-00-1409 (007)	මුද්‍රණ කටයුතු	464,312.50	464,312.50	464,312.50	100%
